# <u>සාර්ථක දිවි මඟට ඔවදනක්</u>

අප ජීවිතය සාර්ථක කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත පිළිබඳ ව, සූත්‍ර පිටකයේ දීඝ නිකායේ තෘතීය භාගයේ පාථික වර්ගයේ සිඟාල සූත්‍රයේ ,විස්තර කර ඇත. ඒ අනුව සලකා බැලීමේ දී ගිහි ජීවිතය ගත කරන විට මුහුණ දෙන විවිධ ගැටළු පිළිබඳව පෙන්වා දී සාර්ථක දිවියකට මග පෙන්වීමක් ලබා දී ඇති අයුරු හඳුනාගත හැකිය. එහිදී බුදුරජාණන් වහන්සේ සිඟාලක නම් ගෘහපති පුත්‍රයා අරමුණු කොට මෙම සූත්‍රය දේශනා කළ සේක. එහි සඳහන් පරිදි සතර කර්මක්ලේශයෝ ප්‍රහීන කරයි ද, සතර අගතියෙන් තොර වෙයි ද, භෝග විනාශමුඛ භයෙන් ආරක්ෂා වෙයි ද, එබදු පුද්ගලයා දෙලොව දියුණුව උදා කර ගැනීමට සමත් වෙයි.

<u>සතර කර්මක්ලේශ</u>,

පාණාතිපාතං අදින්නාදානං මුසාවාදො ච වුච්චති

පරදාරගමනඤ්චේව නප්පසංසන්ති පණ්ඩිතා

ප්‍රාණඝාතය කිරීම

සොරකම් කිරීම

කාමයේ වරදවා හැසිරීම

බොරු කීම

මෙම ක්‍රියා සිදු කරන පුද්ගලයාගේ කෙලෙස් වැඩීම නිරන්තරයෙන් සිදුවෙයි.

සතර අගතිය

ඡන්දා දෝසා භයා මෝහා යෝ ධම්මං අතිවත්තති,

නිහීයති තස්ස යසෝ කාළපක්කේ ච දන්දිමා.

ඡන්දයෙන් හෙවත් කැමැත්තෙන් අන්තගාමී වීම

ද්වේශයෙන් අන්තගාමී වීම

භයෙන් අන්තගාමී වීම

අධික මෝඩකමින් යුතු වීම

මෙම නිසා අවපස සඳ මෙන් සියලු යස ඉසුරු පිරිහෙන්නේය.

භෝග විනාශ මුඛ

කතමානි ඡ භෝගානං අපායමුඛානි න සේවති?
සුරාමේරයමජ්ජපමාදට්ඨානානුයෝගෝ ඛෝ ගහපතිපුත්ත
භෝගානං අපායමුඛං. විකාලවිසිඛාචරියානුයෝගෝ භෝගානං
අපායමුඛං. සමජ්ජාභිචරණං භෝගානං අපායමුඛං.
ජූතප්පමාදට්ඨානුයෝගෝ භෝගානං අපායමුඛං.
පාපමිත්තානුයෝගෝ භෝගානං අපායමුඛං. ආලස්සානුයෝගෝ
භෝගානං අපායමුඛං.

සුරාපානය කිරීම

නොකල්හි වීදි සංචාරයෙහි යෙදීම

සන්දර්ශන බැලීමට යාම

සූදු කෙළියට ඇබ්බැහි වීම

පාප  මිත්‍රයන් ඇසුරු කිරීම

අලස වීම

මෙම කරුණු පුද්ගලයා අපායට ඇද දමන කරුණු වෙයි.එම කරුණු 13න්
ආරක්ෂා වන පුද්ගලයාට පුද්ගලයා දියුණුවට පත්වෙයි.

ලීඩ්ස් බෞද්ධ විහාරයේ ප්‍රකාශනයකි.